**(හැඳින්වීම)**

අද සාමාන්‍ය සමයේ තිස් එක්වන ඉරුදින යි.

තෝරා ගන්නා ලද ජනතාව සමිඳාණන් වහන්සේට අවංකව හා මුළු හදවතින් ප්‍රේම කළ යුතු බව අද පළමු දේව ප්‍රකාශනයෙන් පවසන අතර, ක්‍රිස්තුන් වහන්සේ අප සැම උදෙසා සදහටම පූජකයෙකු වන බව ද, උන්වහන්සේ සියලු ම උත්තම පූජකයන්ට වඩා උතුම් වන බව ද දෙවන දේව ප්‍රකාශනයෙන් ප්‍රකාශ කරයි.

අදට නියමිත සුපුවත තුළින් ද  දෙවියන් වහන්සේට මුළු දිවියෙන් ම ප්‍රේම කිරීම සහ තමාට මෙන් තම අසල්වැසියාට ප්‍රේම කිරීම ශ්‍රේෂ්ඨතම ආඥාව බව අපට ප්‍රකාශ කරන අතර කිතු දහමේ පදනම ප්‍රේමය වන බව එමගින් අවධාරණය කරයි.

එබැවින් අවංකව සහ බැහැපත්ව දේව අණ පනත් පිළිපදිමින්, සමිඳාණන් වහන්සේට මුළු දිවියෙන් ප්‍රේම කරන්නට සහ අන්‍යෝන්‍ය ප්‍රේමයෙන් පිරුණු කිතුනු දිවියක් ගත කරන්නට අවැසි මග පෙන්වීම පතා, අපි සැම මෙම දිව්‍ය යාගය තුළ එක්සිත්ව දෙවි සමිඳුන් යදිමු.

**(විශ්වාසිකයන්ගේ යැදුම්)**

පිළිතුර - ස්වාමිනී, අප කරන යාච්ඤා අසා වදාළ මැනව.

1) ආදර දෙවි පියාණනී, දේව ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දක්වමින් ද අපගේ සොයුරු සොයුරියන් සැබෑ ක්‍රිස්තියානි ප්‍රේමය තුළ පිළිගනිමින් ද ස්වර්ග රාජ්‍යය කරා එක්ව ගමනේ යෙදෙන්නට ෆ්‍රැන්සිස් සුදතුම් පියාණන් ඇතුළු පූජක, පැවිදි සහ ගිහි සැමට අවැසි ශුද්ධාත්ම ආලෝකය නිබඳව දානය කරන පිණිස,

2) ආදර දෙවි පියාණනී, අප මීසම් සංඝයේ සාමාජිකයන් සැම එක ලෙස පිළිගනිමින්, ඔවුන්ගේ ජීවිත වඩා යහපත් කරන්නට සහ ඔවුන්ගේ අවශ්‍යතාවලදී සහයෝගයෙන් කටයුතු කරන්නට අවැසි සහෝදර ප්‍රේමයෙන් අප හදවත් පුරවාලන පිණිස,

3) ආදර දෙවි පියාණනී, අප දේශයේ අනන්‍යතාව සහ සාරධර්ම සුරකිමින් යුක්තිගරුක පාලනයක නියැලෙන්නට හැකි, නිවැරදි ජන නායකයන් මෙවර මැතිවරණයේ දී තෝරා පත්කර ගන්නට සියලු ජනතාවට අවශ්‍ය ප්‍රඥාව සහ මග පෙන්වීම දානය කරන පිණිස,

4) ආදර දෙවි පියාණනී, මෙලොව දිවියෙන් සමුගත් සියලු කිතුනු විශ්වාසිකයන්ගේ ආත්මවලට සහ ශුද්ධිකාගිනි ස්ථානයේ යාච්ඤා පිහිට බලාපොරොත්තුව සිටින සියලු ආත්මවලට සමිඳු වත දැකීමේ භාග්‍යය උදා කරන පිණිස,